# දේශීය ගැමි ශාන්තිකර්ම හා ඒවායෙහි බෞද්ධ ආභාසය

පූජ්‍ය අම්පාරේ ආනන්ද හිමි

A system of rituals dating from distant past is found in Sinhala Buddhist society in Sri Lanka. All these rituals show a Buddhist influence in them. Buddhism is not a religion that emphasizes worship of an invisible supreme force that controls human society or observes rites and rituals to such a force. It should be inquired into how a belief in invisible forces that influence ones life and a mass of rites and rituals performed for them cannot exist in a society that followed such a religion for 2500 years and also the Buddhist influence on them and why that occurred

මෙරට ගැමි බෞද්ධ සමාජය තුළ සම්භාවිත ශාන්තිකර්ම රැසකි. ඒවායෙහි ප්‍රාරම්භක පසුබිම පිළිබඳ අධ්‍යයනයේ දී පෙනී යන්නේ ඇතැම් ශාන්තිකර්ම ප්‍රාග් බෞද්ධ යුගයේ දී ඇරඹී ඇති බවකි. ඇතැම් ශාන්තිකර්ම බෞද්ධ යුගයේ දී බෞද්ධ සංස්කෘතිය මත පදනම් ව බිහි වී තිබේ. මෙහි දී අවධානය යොමු කරනුයේ ප්‍රාග් බෞද්ධ ආභාසය ද ඇති ව අද දක්වා ම ක්‍රියාත්මක ව පවතින ශාන්තිකර්ම පිළිබඳ ව ය. වස් දොස් පිළිබඳ ව ගැමියන් අතර පවත්නා විශ්වාස මේ සඳහා පදනම් වී තිබේ. වස් දොස් යනු මිනිසුනට උපද්‍රව පමුණුවන්නා වූ ද අභිවෘද්ධියට බාධා කරන්නා වූ ද සිසියම් අශුභ දුෂ්ට බලයකි. එය ඇස්වහ, කටවහ, හෝ වහ (සිතුවිලි නිසා ඇතිවන වස්), අඳෝ ඇඩියා (අනුන්ගේ සුභ සිද්ධිය බලා ඊර්ෂ්‍යා සහගත වචන දෙඩීමින් සුසුම් ලෑමක්) ආර්තු මුර්තු (යක්ෂ දෝෂ නිසා සිහිනුත් නැති වීම, වියරු වැටීම) පිනුම්, පෙරළීම්, වෙවුලුම් යනුවෙන් නානාවිධ ස්වරූපවලින් යුක්ත බව මිනිසුන්ගේ

© පූජ්‍ය අම්පාරේ ආනන්ද හිමි
සංස්. පූජ්‍ය කොට්ටුන්ගේ විමලඤාණ හිමි, පාහිණී විද්‍යාලංකාර, කුසුම් පෙරේරා, උපුල් රණසිරි
මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය 15 කලාපය, 2011, මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය